දුරකථන/ தொலைபேசி / Telephone Nos.

| | |
|---|---|
| අමාත්‍යතුමා / அமைச்சர் / Minister | 0112784832<br>Fax - 0112784825 |
| ලේකම් / செயலாளர் / Secretary | 0112784811<br>Fax - 0112785162 |
| කාර්යාලය / அலுவலகம் / Office | 0112785141-50<br>Fax - 0112785491 |

ඊ-මේල් / மின்னஞ்சல் / E.mail- info@moe.gov.lk
වෙබ් පිටුව / இணையத்தளம் / Web address- www.moe.gov.lk
ඔබේ අංකය / உமது இல. / Your No ..............................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, බත්තරමුල්ල.
'இசுருபாய', ஸ்ரீ ஜயவர்த்தனபுர கோட்டே, பத்தரமுல்லை.
'Isurupaya', Sri Jayawardanapura Kotte, Baththaramulla.

මගේ අංකය / எனது இல. / My No: ED/08/26/24/04/17

දිනය / திகதி / Date: 2017.06. 21

චක්‍රලේඛ අංක - 21/2017

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කොට්ඨාස භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම පරිවේණාධිපති හිමිවරුන්,
සියලු ම විදුහල්පතිවරුන්,

## <u>පාසල්, පිරිවෙන් හා අනිකුත් අධ්‍යාපන ආයතන සඳහා අන්තර්ජාල පහසුකම් ලබාදීම</u>

1. නූතන තොරතුරු තාක්ෂණ විප්ලවයත් සමඟ වර්තමාන ලෝකය අංකිත සමාජයක් (Digital Society) බවට පරිවර්තනය වෙමින් පවතී. එම අංකිත සමාජයට යෝග්‍ය අංකිත පුරවැසියන් (Digital Citizen) බවට අනාගත ශ්‍රී ලාංකේය ශිෂ්‍ය ප්‍රජාව පත් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය යටතේ පාසල් හා පිරිවෙන් වෙත අන්තර්ජාල ප්‍රවේශ අවස්ථා සැලසීම ප්‍රධාන අවශ්‍යතාවක් ලෙස හඳුනාගෙන ඇත. ඒ අනුව, මෙම අන්තර්ජාල සබඳතාව වඩා වේගවත්, ආරක්ෂිත හා දැරිය හැකි පිරිවැයකින් යුක්ත අන්තර්ජාල සබඳතාවක් විය යුතු ය. එම අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් හා මාර්ගෝපදේශ මෙම චක්‍රලේඛය හා මේ සමඟ ඇති උපදෙස් සංග්‍රහය මඟින් ලබා දේ.

2. මෙම අන්තර්ජාල පහසුකම් සැපයීමට අදාළ කටයුතු සම්බන්ධීකරණය හා අන්තර්ජාල සබඳතා නිසි පරිදි භාවිත වන්නේ ද පිළිබඳ ව අධීක්ෂණය හා නියාමනයට අදාළ වගකීම පහත පරිදි ය.
   i. ජාතික මට්ටම - අධ්‍යාපන අමාත්‍යාංශයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපන අධ්‍යක්ෂ
   ii. පළාත් මට්ටම - පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්බන්ධීකරණ නිලධාරී
   iii. කලාප මට්ටම - කලාප තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්බන්ධීකරණ නිලධාරී

3. රජයේ පාසල්

3.1 පාසල් පාදක කළමනාකරණය වඩාත් ශක්තිමත් කිරීම උදෙසා 2013.11.28 දින නිකුත් කර ඇති අංක 2013/07 දරණ චක්‍රලේඛය හා මාර්ගෝපදේශ අත්පොතේ අංක 12 යටතේ සපයා ඇති පාසල් ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාළ උපදෙස් පරිදි, පාසලේ අවශ්‍යතාව නිවැරදිව හඳුනා ගනිමින් පාසලට සුදුසු අන්තර්ජාල සම්බන්ධතාවක් තෝරා ගැනීමට මෙම නව උපදෙස් සංග්‍රහය මඟින් අවශ්‍ය මඟ පෙන්වීම සපයනු ලැබේ. එසේම, පාසල් වෙත අන්තර්ජාල පහසුකම් සැපයීම උදෙසා මීට පෙර භාවිත කළ ක්‍රමවේද තුළ පැවති දුර්වලතා අවම කරමින්, අදාළ ගාස්තු ගෙවීමට අවශ්‍ය උපදෙස්ද මෙමඟින් සපයා ඇත.

3.2 අන්තර්ජාල පහසුකම් ලබා ගැනීමට හා බිල්පත් පියවීමට අදාළව රජයේ පාසල් විසින් පහත සඳහන් පියවර අනුගමනය කරනු ලැබිය යුතුය.

i. මෙම චක්‍රලේඛය සමඟ නිකුත් කරනු ලබන පාසල් සඳහා අන්තර්ජාල පහසුකම් ලබා දීමේ මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස්වලට අනුව හා 2013/07 චක්‍රලේඛයේ සඳහන් පාසල් ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාළ උපදෙස් අනුගමනය කරමින් පාසල් වෙත සුදුසු අන්තර්ජාල සැපයුමක් තෝරාගත යුතු ය. මේ සඳහා අවශ්‍ය තාක්ෂණික සහය පාසල් තාක්ෂණ ඇගයීම් කමිටුව මඟින් ලබා ගත යුතු අතර එසේ ලබා ගැනීමට අපහසු අවස්ථාවල දී කලාපීය දැනුම හා ජාලකරණ විසඳුම් සංචිත ගුරුභවතුන්ගේ සහය මේ සඳහා ලබා ගත යුතු ය.

ii. අන්තර්ජාල පහසුකම් ලබා ගැනීම වෙනුවෙන් ගෙවීමට සිදුවන මාසික ගාස්තුව පාසල විසින් වාර්ෂික සංවර්ධන සැලසුමේ පුනරාවර්තන වියදම් යටතට ගැනෙන වැය විෂයය අංක REx 3.2 යටතේ පාසල් අයවැය ඇස්තමේන්තුවට ඇතුළත් කර මෙම බිල්පත් ගෙවීමට අවශ්‍ය වන මාසික ප්‍රතිපාදන සලසා ගැනීමට වාර්ෂිකව කටයුතු කළ යුතු ය.

iii. මෙම බිල්පත් ගෙවීම සම්බන්ධ තොරතුරු වෙන ම ගොනුවක පවත්වාගෙන යා යුතු අතර 2013/07 චක්‍රලේඛයේ උපදෙස් පරිදි අන්තර්ජාල සබඳතා ගාස්තු පිළිබඳව ද ගිණුම්ගත කිරීමේ කටයුතු කළ යුතු වේ.

4. පිරිවෙන් හා අනෙකුත් අධ්‍යාපන ආයතන

4.1 මෙම මාර්ගෝපදේශ සංග්‍රහයේ දක්වා ඇති අන්තර්ජාල පැකේජවලට අදාළ පිරිවිතර සකස් කර ඇත්තේ වර්තමානයේ පාසල්වල පවතින අවශ්‍යතාව සැලකිල්ලට ගැනීම මඟින් වන අතර, පාසල්වලට අමතර ව පිරිවෙන්වලට හා අධ්‍යාපන අමාත්‍යාංශය යටතට ගැනෙන අනෙකුත් අධ්‍යාපන ආයතනවලට අන්තර්ජාල පහසුකම් සලසා ගැනීමේ දී මෙම මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් හා විධිවිධාන අදාළ කර ගත හැකි ය.

4.2 මෙම පිරිවිතරවලට වෙනස් අවශ්‍යතා පවතින අවස්ථාවන්හි දී ප්‍රසම්පාදන උපදෙස් අනුගමනය කරමින් පිරිවිතර සකස් කර අන්තර්ජාල පහසුකම් සපයා ගැනීම සිදු කළ යුතු වේ. පිරිවෙන් හා අනෙකුත් අධ්‍යාපන ආයතන විසින් ලබා ගනු ලබන අන්තර්ජාල සබඳතා සඳහා එම ආයතන විසින් මාසික බිල්පත් ගෙවීම සිදු කළ යුතු වේ.

5. පාසල් හා අධ්‍යාපන ආයතනවලට අන්තර්ජාල පහසුකම් සලසා ගැනීම සම්බන්ධ ව මෙතෙක් නිකුත් කර ඇති චක්‍රලේඛ උපදෙස් අභිභවා මින් ඉදිරියට මෙම චක්‍රලේඛයේ නීතිරීති රෙගුලාසි හා විධිවිධාන බල පැවැත්වෙන බව දන්වමි.

සුනිල් හෙට්ටිආරච්චි
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් -

01. විගණකාධිපති
02. අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු ම අතිරේක ලේකම්වරුන්
03. ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන), අධ්‍යාපන අමාත්‍යාංශය
04. සියලු ම අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, අධ්‍යාපන අමාත්‍යාංශය
05. සියලු ම පළාත් තොරතුරු තාක්ෂණ සම්බන්ධීකරණ නිලධාරීන්
06. සියලු ම කලාප තොරතුරු තාක්ෂණ සම්බන්ධීකරණ නිලධාරීන්
07. සියලුම පරිගණක සම්පත් මධ්‍යස්ථාන භාර උපදේශකවරුන්

# පාසල් සඳහා අන්තර්ජාල පහසුකම් ලබා දීම පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය

1.0 සමස්ත අධ්‍යාපන පද්ධතිය තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය සවි බල ගැන්වීම ඉලක්ක කර ගනිමින් පාසල් සඳහා අන්තර්ජාල සබඳතා ලබා දීම සිදු කෙරේ. එමගින් පහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂිත ය.

<u>කෙටි කාලීන අරමුණු</u>

- අන්තර්ජාලයේ පවතින සම්පත්වලට ප්‍රවේශ වීම.
- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට අභිප්‍රේරණය ලබා දීම.
- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ගුණාත්මක සංවර්ධනය.
- යාවත්කාලීන වූ දැනුම සඳහා ප්‍රවේශ අවස්ථා සැලසීම.
- නව නිර්මාණ සිදුකිරීමට සිසුන් පෙළඹවීම.
- ගුරු සිසු සන්නිවේදනයට මාධ්‍යයක් ලබා දීම.
- පාසල තුළ ඉගෙනුම් උපක්‍රම වැඩි වශයෙන් භාවිතයට අවකාශ සැලසීම.
- අධ්‍යාපන කළමනාකරණයට අදාළ ක්‍රියාවලීන් සඳහා භාවිතයට පෙළඹවීමක් ඇති කිරීම.

<u>මධ්‍ය කාලීන අරමුණු</u>

- පාසල් තුළින් නව නිර්මාණ බිහිකිරීම.
- නව දැනුමින් යාවත්කාලීන වූ ගුරු පිරිසක් බිහිකිරීම.
- ස්වයං අධ්‍යයනය තුළින් දැනුම සොයා යන්නෙකු බවට පත් කිරීම.
- විචාරශීලී ඉගෙනුම් අවස්ථා සඳහා සිසුන් සම්බන්ධ කරවීම.
- සිසුන් අතර දැනුම හුවමාරුව
- විධිමත් ඇගයුම් ක්‍රියාවලියක් බිහි කිරීම.
- අධ්‍යාපන කළමනාකරණයට අදාළ ක්‍රියාවලීන් ශක්තිමත් කිරීම

<u>දිගු කාලීන අරමුණු</u>

- අනාගත වැඩ ලෝකයට අනුවර්තිත සිසු පරපුරක් බිහි කිරීම.
- තාක්ෂණ කුසලතා සපිරි පුරවැසියන් බිහි කිරීම.
- පරිගණක සාක්ෂරතාව ඉහළ නැංවීම.
- අංකිත බෙදීම ( Digital divide) අඩු කිරීම.
- ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව (Gender Equity)
- සදාචාර සම්පන්න සක්‍රිය සමාජ ජාල බිහි කිරීම.
- අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිවලින් සවිබල ගැන් වූ පාසල් පද්ධතියක් ස්ථාපිත කිරීම

## 1.1 පාසල් අන්තර්ජාල භාවිත ප්‍රතිපත්තිය (School Internet Usage Policy)

පාසල්වල අන්තර්ජාල භාවිතයේ දී පහත සඳහන් උපදෙස් අනුගමනය කළ යුතු ය.

- නුසුදුසු අන්තර්ජාල පිවිසුම් වළක්වාලීම සඳහා Web filtering Software මගින් වාරණය කර පාසල් වෙත ලබා දීම සිදු වන අතර එම ආරක්ෂිත උපක්‍රම අහිබවා කටයුතු නොකළ යුතු ය.
- ගුරුවරුන් හා ශිෂ්‍යයන් යන දෙපිරිසට ම ආරක්ෂිත ව අන්තර්ජාලය භාවිත කිරීම සම්බන්ධ ව පුහුණු කිරීම හා දැනුමවත් කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු, කලාප අධ්‍යාපන කාර්යාල හා පාසල් මගින් ලබා දේ.
- ඉගෙනුම් ක්‍රියාවලියට පරිබාහිර, අනුමත නොවන මෘදුකාංග උඩුගත කිරීම (Upload) හා බාගත කිරීම (Download) සඳහා අවසර නොමැත.
- ප්‍රතිවෛරස් මෘදුකාංග නිරන්තරයෙන් යාවත්කාලීන කිරීම සිදු කළ යුතු වේ.
- ගුරුභවතුන්ගේ අවසරයකින් තොර ව කිසිදු ආචයන මාධ්‍යයක් (CD, DVD, Pen Drive, etc) භාවිත නොකළ යුතු ය.
- පාසලට හෝ පාසල හා සම්බන්ධ පාර්ශවයන්ට හෝ අපකීර්තියක් අත් නොවන පරිදි අන්තර්ජාලය භාවිත කළ යුතු ය.
- නීති විරෝධී, නුසුදුසු වෙබ් අඩවිවලට හිතා මතා ප්‍රවේශ නොවිය යුතු ය.
- හදිසියේ, නොදැනුවත්කමින් හෝ වැරදීමකින් හෝ ශිෂ්‍යයකු එවැනි නුසුදුසු වෙබ් අඩවියකට ප්‍රවේශ වුවහොත් ඒ පිළිබඳව වහාම පරිපාලක ගුරුභවතා (Administrator)ට වාර්තා කළ යුතු ය.
- සිසුන් අන්තර්ජාල පහසුකම භාවිත කළ යුත්තේ අධ්‍යාපනික අවශ්‍යතා සඳහා පමණි.
- අන්තර්ජාලය හරහා (වෙබ් අඩවියකින් හෝ වෙනත් මාධ්‍යකින් හෝ) යම් තොරතුරක් බාගත කර වෙනත් අවශ්‍යතාවක් සඳහා භාවිතා කරන්නේ නම් එහි ප්‍රකාශන අයිතිය සඳහන් කළ යුතු ය.
- කිසිම අවස්ථාවක පෞද්ගලික තොරතුරු අන්තර්ජාලය තුළින් ප්‍රකාශ කිරීමෙන් හෝ හෙළි කිරීමෙන් හෝ වැළකී සිටිය යුතු ය.
- පාසලේ තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තියට පටහැණි කිසිදු දෙයක් පළ කිරීමෙන් වැලකිය යුතුය.
- අන්තර්ජාලය භාවිතයෙන් සිදුකරන සෑම කාර්යයක් ම ගුරුභවතුන් විසින් අධීක්ෂණය හා නියාමනය සිදු කරන බවට සිසුන් දැනුවත් කළ යුතු ය.

## 1.2 විද්‍යුත් තැපැල් (E-Mail)

- ගුරු භවතාගේ අනුමැතිය හා නියාමනය මත පාසල තුළ දී විද්‍යුත් තැපැල් භාවිත කිරීම සිදු කළ යුතු ය.
- නීති විරෝධී හෝ නුසුදුසු හෝ අන් අයකුට හිරිහැරයක් සිදු කරන හෝ කිසිදු තොරතුරක් විද්‍යුත් තැපැල හරහා හුවමාරු නොකළ යුතු ය.
- තමන්ගේ හෝ වෙනත් කිසිවකුගේ හෝ පෞද්ගලික තොරතුරු (ලිපිනය, දුරකථන අංකය, ඡායාරූප) විද්‍යුත් තැපැල තුළින් හෝ හුවමාරු නොකළ යුතුය.
- විද්‍යුත් තැපැල මගින් හෝ අන්තර්ජාලය තුළින් හෝ හඳුනාගත් කිසිම පුද්ගලයකු හා මුහුණට මුහුණ සංවාදයේ නොයෙදිය යුතු ය.
- විද්‍යුත් තැපැල තුළින් ඇමුණුම් යැවීමේ දී ඒ සියලු ඇමුණුම් ගුරු භවතාගේ අනුමැතිය ඇති ව යැවිය යුතු ය.

## 1.3 අන්තර්ජාලය තුළින් සංවාද කිරීම (Internet Chat)

- අන්තර්ජාලය තුළින් සංවාදයේ යෙදීම සඳහා පාසලෙන් අවසර ලබා ගත යුතු ය.
- අධ්‍යාපන කාර්යයන් සඳහා පමණක් අන්තර්ජාල සංවාදය යොදාගත හැකි අතර එය ද ගුරුභවතකුගේ නියාමනය මත සිදු කළ යුතු ය.

## 1.4 වෙබ් අඩවි (Web Site)

- පාසල් වෙබ් අඩවියේ පළ කිරීමට සිසුන්ට අවසර ලබා දෙනුයේ අනුමත විෂයය සන්ධාරයන් පමණි.
- වෙබ් අඩවියේ සිසුන්ගේ තොරතුරක්, ඡායාරූපයක්, නිර්මාණයක් පළ කරන්නේ නම් එය දෙමාපිය අවසරය ලබා ගෙන සිදු කළ යුතු ය.
- අවසර සහිතව පාසල් වෙබ් අඩවියේ සිසුවකුගේ නිර්මාණයක් පළ කරන්නේ නම් එහි අයිතිය සිසුවා සතු වේ.

## 1.5 පෞද්ගලික සන්නිවේදන උපාංග (Personal Device)

- අන්තර්ජාල භාවිත ප්‍රතිපත්තියට අනුව සිසුන්ට තම පෞද්ගලික සන්නිවේදන උපාංග භාවිත කරමින් ඡායාරූප හෝ වීඩියෝ හෝ ගැනීම, යැවීම, අන්තර්ජාල ප්‍රවේශය ආදී කටයුතු පාසල තුළ දී සිදු කළ නොහැකිය.

ඉහත උපදෙස් උල්ලංඝනය වන අවස්ථාවල දී,

- විනය ක්‍රියාමාර්ග ගත යුතු ය. (ලිඛිත අවවාද, කෙටිකාලීන අන්තර්ජාල ප්‍රවේශ අහිමි කිරීම ආදී)
- මෙවැනි වැරදි ක්‍රියා දිගින් දිගටම සිදු කළහොත් ඉහළ අධිකාරියට දැනුම් දීමේ හැකියාව ද ඇත.

මෙම උපදෙස් ඇතුළත් කරමින් සකසා ඇති ඇමුණුම 1 හි සඳහන් අන්තර්ජාල භාවිතය පිළිබඳ ශිෂ්‍ය උපදෙස් මාලාව මෙම පහසුකම භාවිතා කරන සිසුන් වෙත යොමු කර, ඒ පිළිබඳ පැහැදිලි කර, එම උපදෙස් මාලාව අනුගමනය කරන බවට සිසුන්ගේ හා දෙමාපියන්ගේ එකඟතාව ලබා ගත යුතු ය. පාසල තුළ අන්තර්ජාලය භාවිත කිරීමේ ප්‍රතිපත්ති මාලාව පිළිබඳ පාසලේ සියලු ම සිසුන් නිරන්තරයෙන් දැනුම්වත් කළ යුතු අතර ඒ පිළිබඳ උපදෙස් මාලාව සියලු ම සිසුන්ට, ගුරු භවතුන්ට හා දෙමාපියන්ට පැහැදිලිව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කළ යුතු යි.

# 2.0 පාසල් සඳහා සුදුසු අන්තර්ජාල සබඳතාවක් ලබා ගැනීම

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිර්දේශ කරනු ලබන ඇමුණුම 2 හි සඳහන් අන්තර්ජාල සබඳතා (පැකේජ) වලින් සුදුසු සබඳතාවයක් එහි සඳහන් මිල ඉදිරිපත් කර ඇති අන්තර්ජාල සේවා සැපයුම්කරුවන් මගින් ලබා ගැනීම සිදු කළ යුතු ය.

පාසල සඳහා සුදුසු අන්තර්ජාල සබඳතා පැකේජයක් තෝරා ගැනීමේදී පහත දැක්වෙන නිර්ණායක සැලකිල්ලට ගත යුතු ය.

- අන්තර්ජාල පිවිසුම සඳහා වරකට සම්බන්ධ වන උපරිම පරිගණක සංඛ්‍යාව (පාසල තුළ)
- පාසල විසින් අන්තර්ජාල සබඳතාව මගින් ලබා ගැනීමට අපේක්ෂිත සේවාවන්
- මසකට පාසල විසින් මේ සඳහා දැරිය හැකි උපරිම මූල්‍යමය හැකියාව
- දැනටමත් අන්තර්ජාල සබඳතාවක් පවතී නම් එම සබඳතාව පවත්වාගෙන යාම හෝ මෙම නව අන්තර්ජාල සබඳතාවට මාරු වීම අවශ්‍යතාව මත සිදු කළ හැකි ය.

- පාසලේ අවශ්‍යතාව මත අන්තර්ජාල සබඳතා කිහිපයක් වුවද භාවිත කළ හැකි ය.
- පාසල පිහිටි ප්‍රදේශය වඩාත් හොඳින් ආවරණය කරන (Coverage) අන්තර්ජාල සේවා සපයන්නන් හඳුනා ගැනීම
- දැනට අදාළ ප්‍රදේශය ආවරණය වන වඩාත් කාර්යක්ෂම තාක්ෂණය හඳුනාගැනීම (උදා - 4G Broadband, ADSL, WiMax, ...)
- පාසල විසින් තීරණය කරනු ලබන අන්තර්ජාල සබඳතාව ලබා ගැනීමට අදාළ ව සම්බන්ධීකරණය සිදු කර ගැනීම සඳහා අදාළ සමාගම්වල සම්බන්ධීකරණ නිලධාරීන්ගේ දුරකථන අංක විද්‍යුත් තැපැල් ලිපින ඇමුණුම 3 හි දක්වා ඇත.

ඇමුණුම 02 හි පැකේජ තෝරාගැනීම සම්බන්ධව විශේෂ කරුණු සඳහන් කර ඇත්නම් එම කරුණු සැලකිල්ලට ගත යුතුය.

ඉහත නිර්ණායක යටතේ පාසලේ අවශ්‍යතාවට වඩාත් ගැළපෙන අන්තර්ජාල පැකේජය හා සේවා සැපයුම්කරු පාසල් සංවර්ධන කමිටුව මගින් තෝරා ගැනීම සිදුකළ යුතු ය. මේ සඳහා අවශ්‍ය තාක්ෂණික සහය කලාපීය දත්තාංශ හා ජාලකරණ විසඳුම් කණ්ඩායම මගින් ලබාගත හැකි ය.

- පාසල තුළ බහුල ව පරිගණක භාවිතය සිදු කරන ස්ථානයක් අන්තර්ජාල සබඳතාව ස්ථාපනය කිරීමට තෝරාගත යුතු ය.
- Router (මාර්ග කාරකය) මාදිලිය, Serial number, සබඳතාව ලබා දුන් දිනය හා Circuit ID යන තොරතුරු ඇතුළත් ලොග් සටහන් තැබිය යුතු ය. නඩත්තු හා යාවත්කාලීන කිරීම්වලදී ද ලොග් සටහන් තැබීම අනිවාර්ය වේ. Router (මාර්ග කාරකය) බඩු වට්ටෝරු පොතට ඇතුළත් නොකළ යුතු ය.) මෙයට අමතර ව මෙම තොරතුරු ඇතුළත් ලිපිගොනුවක් අන්තර්ජාල සබඳතාව සම්බන්ධයෙන් පවත්වා ගෙන යායුතු ය.

## 2.1 මෙම අන්තර්ජාල සේවා සමඟ සපයනු ලබන වෙනත් සේවා

- Web filtering සේවාව

## 2.2 අන්තර්ජාල සබඳතා සඳහා අය කරනු ලබන ගාස්තු හා ගෙවීම් ක්‍රමවේදය

1. මූලික ස්ථාපන ගාස්තු (Router උපකරණවලට අදාළ සේවා ගාස්තු ද සහිතව)
   - මෙම අන්තර්ජාල සබඳතා පැකේජ සියල්ලට මූලික ස්ථාපන ගාස්තුවකින් තොරව ලබා දීම සිදු කරනු ලැබේ.
   - මෙම අන්තර්ජාල සබඳතාවලට අදාළව මූලික ස්ථාපනය සිදු කර සබඳතා ලබා දීම සිදු කළ පසු, එම සබඳතාව නිසි පරිදි ක්‍රියාත්මක වන බවට වාර්තාවක් විදුහල්පති විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාවට පිටපතක් සහිතව කලාප තොරතුරු තාක්ෂණ සම්බන්ධීකරණ නිලධාරී වෙත ලබාදිය යුතු ය. (ඒ සඳහා ඇමුණුම 4 භාවිත කරන්න)
   - මූලික ස්ථාපනයට අදාළව සවි කරනු ලබන Router උපකරණ අදාළ අන්තර්ජාල සේවා සැපයුම් සමාගම සතු වේ.
2. මාසික බිල්පත් ගාස්තුව
   - මාසික ගාස්තුව සඳහන් බිල්පතක් අදාළ සේවා සැපයුම්කරු විසින් පාසල වෙත නිකුත් කරනු ඇත.

- මෙම මාසික ගාස්තුව ඇතුළත් බිල්පතට අදාළ මුදල පාසල විසින් අදාළ සේවා සැපයුම්කරුට ගෙවිය යුතු ය.
  මෙම මාසික ගාස්තුවට අදාළ ගෙවීම් සඳහා අදාළ වන පිරිවැය 2013/07 චක්‍රලේඛය උපදෙස් පරිදි පාසල විසින් සකස් කරනු ලබන වාර්ෂික ක්‍රියාකාරී සැලසුමට ඇතුළත් කර අනුමත කර ගත යුතු ය.

3. අමතර දත්ත භාවිතය
   - අමතර දත්ත ලබා ගැනීමට පෙර කළමනාකරණ කමිටුවෙන් අනුමැතිය ලබා ගත යුතු ය.
   - එම අමතර පිරිවැය ද පාසල විසින් දැරිය යුතුවේ.
   - ඒ සඳහා ගාස්තු, ලබාගත් පැකේජයට අදාළ ව ලබා දී ඇති ඇමුණුම 02 හි සඳහන් පරිදි වේ.

## 2.3 ලබා ගනු ලබන අන්තර්ජාල සේවා සැපයුම භාවිතයෙන් ලබාගත හැකි සේවාවන්

මෙම සබඳතාව පාසල් වේලාවෙන් පසු හා පාසල් නිවාඩු දිනවලදී බාහිර පාර්ශව වෙත සේවාවන් ලබා දීම සඳහා භාවිතා කළ හැකි ය. බාහිර ප්‍රජාවට ලබා දීම සඳහා ලබා ගනු ලබන අයකිරීම් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති 2005/29 චක්‍රලේඛයට අනුකූල ව හා පාසල් කළමනාකරණ කමිටුවේ අනුමැතිය මත සිදු කළ හැකිය.

## 2.4 පාසල් අන්තර්ජාල සබඳතා ප්‍රශස්ත ලෙස භාවිතය සඳහා පුහුණුව

පාසල් පද්ධතිය තුළ අන්තර්ජාල භාවිතය කරමින් වඩා යෝග්‍ය ඉගෙනුම් ඉගැන්වීම ක්‍රමවේදයන් ඇති කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශයන් සඳහා ජාල කළමනාකරණ කටයුතු සිදු කරනු ලබන ගුරුභවතුන් සඳහා පහත සඳහන් අන්තර්ගත සහිත පුහුණුවක් ලබා දීම සිදු කළ යුතු වේ.

- පරිගණක ජාල වින්‍යාසකරණය සහ කළමනාකරණය (Network Configuration and Management)
- Server Configuration

## 2.5 අන්තර්ජාල භාවිතය පිළිබඳ නියාමනය හා අධීක්ෂණය

1. අන්තර්ජාලය ඵලදායී ලෙස භාවිතය පිළිබඳව පාසල මගින් අභ්‍යන්තර නියාමනයක් සිදු කළ යුතු ය.
   දෛනික පරිගණක භාවිත වාර්තා පොත, පරිගණක විද්‍යාගාර වාර්තා පොත, පන්ති වාර්තා පොත, ... ආදිය පරිගණක විද්‍යාගාරයේ අන්තර්ජාලය භාවිතය නියාමනයට භාවිතා කළ හැකි ය. (ඒ සඳහා සුදුසු මෘදුකාංග ද්‍රව්‍යද භාවිත කළ හැකි ය.)

2. මාසික භාවිතය පිළිබඳව (Usage) පරීක්ෂාවක් පාසලට අමතර ව කලාප අධ්‍යාපන කාර්යාලය, පළාත් අධ්‍යාපන කාර්යාලය හෝ අධ්‍යාපන අමාත්‍යාංශය හෝ මගින් සිදු කිරීම සඳහා ක්‍රමවේදයන් ද අදාළ සේවා සැපයුම්කරුවන මගින් ලබා ගැනීමට අපේක්ෂිත ය.

## 2.6 අන්තර්ජාල සබඳතා අත්හිටුවීම හා භාවිත පැකේජය මාරු කිරීම

පාසල් මඟින් ලබා ගනු ලබන අන්තර්ජාල සබඳතා තුළින් ඵලදායී භාවිතයක් නොවන බවට තහවුරු වන්නේ නම් සේවා සැපයුම්කරුට දැන්වීමෙන් පසු සබඳතාව අත්හිටුවීමට විදුහල්පති විසින් කටයුතු කළ යුතු ය. ඒ බව හේතු සහිත ව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ වෙත දැනුවත් කළ යුතු ය.

ඇමුණුම 02 මඟින් ලබා දී ඇති අන්තර්ජාල පැකේජවලට අදාළ පිරිවිතර සකස් කිරීම සිදු කර ඇත්තේ වර්තමානයේ භාවිත වන තාක්ෂණය, වර්තමාන පාසල් අවශ්‍යතාව හා අන්තර්ජාල සේවා සැපයුම්කරුවන්ගේ වර්තමාන අන්තර්ජාල සේවා සැපයුම් හැකියාව සැලකිල්ලට ගැනීමෙනි. ඉදිරියේදී ඇතිවන තාක්ෂණික වෙනස්වීම් හා පාසල් අවශ්‍යතා අනුව මෙම පිරිවිතරවලට වෙනස් අන්තර්ජාල සැපයුම් හඳුන්වා දීම සිදුවුවහොත් එම සැපයුම්වලට මාරුවීමේ හැකියාව පාසල් බලධාරීන් සතු ය.

පාසල මඟින් ලබා ගන්නා පැකේජය පාසලේ අවශ්‍යතාවට නොගැළපෙන බව පෙනී යන්නේ නම පාසල් කළමනාකරණ කමිටුවේ නිර්දේශය මත වෙනත් පැකේජයක් වෙත මාරු වීමට හැකියාව පවතී. මෙම මාරුවීම මූල්‍යමය අලාභයක් නොවන ලෙස සිදු කිරීමට හැකියාවක් පවතින අතර පැකේජ මාරු වන්නේ නම් ඒ මාරුවීම සිදු කර ගැනීමෙන් පසු අධ්‍යාපන අමාත්‍යාංශය සහ පළාත්, කලාප බලධාරීන් වෙත දැන්විය යුතු ය. මෙහි දී මූල්‍යමය ගෙවීමක් අවශ්‍ය වුවහොත් එය පාසල මඟින් දැරිය යුතු වේ.

## 3.0 පාසලේ අභ්‍යන්තර පරිගණක ජාලය

පාසල විසින් ලබා ගනු ලබන අන්තර්ජාල සබඳතාව භාවිත කිරීමට අවශ්‍ය අභ්‍යන්තර පරිගණක ජාලය (Network) ක්‍රමවත්ව  සකස් කර ගත යුතු ය. ඒ සඳහා පහත උපදෙස් අනුගමනය කළ යුතු ය.

- ජාලය රැහැන් සහිත ව හෝ රහිත ව හෝ සකස්කර ගැනීම.
- අවශ්‍ය පරිදි ජාලය ව්‍යාප්ත කිරීම සඳහා switches හා access point භාවිත කිරීම.
- නව ජාලගත කිරීමේදී හා switches මාරු කරන්නේ නම් වේගය 10/100/1000 Mbps switches හා Cat 6 රැහැන් හා ඉදිරි තාක්ෂණ අවශ්‍යතාවට ගැළපෙන උපාංග භාවිත කිරීම යෝග්‍ය වේ.
- සුදුසු ජාල ආකෘතියක් (Architecture) භාවිත කිරීම. (උදා - Workgroup, Client- Server)
- අන්තර්ජාල ආරක්ෂණ ක්‍රමවේද සඳහා සුදුසු මෘදුකාංග හා තාක්ෂණය භාවිත කිරීම.

## 4.0 2016/01 චක්‍රලේඛ 3 (ඇ) අනුව නම් කරනු ලබන ගුරුභවතාට පහත සඳහන් වගකීම පැවරීම.

- පරිගණක ජාලය භාවිතය අධීක්ෂණය
- අන්තර්ජාල සම්බන්ධතා දෝෂ වාර්තා කිරීම
- ජර්නලය පවත්වා ගෙන යාම
- අවශ්‍ය තොරතුරු විදුහල්පති මඟින් කලාප/පළාත්/අධ්‍යාපන අමාත්‍යාංශයට යොමු කිරීම
- අන්තර්ජාලය අවභාවිතය වැළැක්වීම සඳහා සුදුසු ක්‍රියා මාර්ග අනුගමනය කිරීම
- පාසලේ අවශ්‍යතාව අනුව ජාලය නවීකරණයට අවශ්‍ය නිර්දේශ පාසල් පරිගණක විද්‍යාගාර කළමනාකරණ කමිටුව මඟින් ලබා ගැනීම
- ආරක්ෂිතව අන්තර්ජාලය භාවිතය පිළිබඳ උපදෙස් ලබා දීම, මඟ පෙන්වීම, පාසල් උපදෙස් මාර්ගෝපදේශ සංග්‍රහය නිකුත් කිරීම
- නිතර භාවිත වන මෘදුකාංග බාගත කර (download) සර්වර් (Server) එකක ස්ථාපනය

**ඇමුණුම 01**

පාසලේ නම -

ශිෂ්‍යයාගේ නම-

ශ්‍රේණිය -

**ශිෂ්‍ය ප්‍රතිඥාව**

පාසලේ අනුමත අන්තර්ජාල භාවිත ප්‍රතිපත්ති මාලාව අනුගමනය කිරීමට එකඟ වෙමි. පාසල මගින් ඉතා පැහැදිලි ව ක්‍රියාත්මක කරන ලද එම ප්‍රතිපත්ති සියල්ල මා විසින් නිවැරදිව තේරුම් ගත් බව ද, සඳහන් කරමි.

...................................

ශිෂ්‍ය අත්සන                                        දිනය -

**දෙමාපිය/භාරකරු ප්‍රතිඥාව**

ඉහත දරුවාගේ නීත්‍යානුකූල භාරකරු වශයෙන් පාසලේ අනුමත අන්තර්ජාල භාවිත ප්‍රතිපත්ති මාලාවට අනුකූල ව අන්තර්ජාලය භාවිත කිරීමට ඔහුට/ ඇයට අවසර ලබා දෙමි. එම භාවිතය අධ්‍යාපන කාර්යයන් සඳහා පමණක් ම බවටත්, පාසල මගින් ඔහු/ඇය අන්තර්ජාලය සුරක්ෂිත ව භාවිත කිරීම සඳහා සියලු පියවර ගෙන ඇති බවටත්, ඔහුගේ/ ඇයගේ නුසුදුසු වෙබ් අඩවි භාවිතය පිළිබඳ වගකීම පාසලට නොපැවරෙන බවටත්, එකඟ වෙමි.

...................................

දෙමාපිය/ භාරකරු අත්සන                                        දිනය -

**ශිෂ්‍ය හා දෙමාපිය/භාරකරුගේ ප්‍රතිඥාව සඳහා උපදෙස්**

- නුසුදුසු අන්තර්ජාල පිවිසුම් වළක්වාලීම සඳහා Web filtering Software මගින් වාරණය කර පාසල් වෙත ලබා දීම සිදු වන අතර එම ආරක්ෂිත උපක්‍රම අභිබවා කටයුතු නොකළ යුතු ය.
- ගුරුවරුන් හා ශිෂ්‍යයන් යන දෙපිරිසට ම ආරක්ෂිත ව අන්තර්ජාලය භාවිත කිරීම සම්බන්ධ ව පුහුණු කිරීම හා දැනුවත් කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කලාප අධ්‍යාපන කාර්යාලය හා පාසල් මගින් ලබා දේ.
- ඉගෙනුම් ක්‍රියාවලියට පරිබාහිර අනුමත නොවන මෘදුකාංග උඩුගත කිරීම (Upload) හා බාගත කිරීම (Download) සඳහා අවසර නොමැත.
- ප්‍රතිවෛරස් මෘදුකාංග නිරන්තරයෙන් යාවත්කාලීන කරනු ලැබේ.
- ගුරුභවතුන්ගේ අවසරයකින් තොරව කිසිදු ආචයන මාධ්‍යයක් (CD, DVD, Pen Drive, etc) භාවිත කළ නොහැකි ය.
- පාසලට හෝ පාසල හා සම්බන්ධ පාර්ශවයන්ට හෝ අපකීර්තියක් අත් නොවන පරිදි අන්තර්ජාල භාවිත කළ යුතු ය.
- නීති විරෝධී නුසුදුසු වෙබ් අඩවිවලට හෝ වෙනත් මාධ්‍යයකට හෝ හිතා මතා ප්‍රවේශ නොවිය යුතු ය.

- හදිසියේ නොදැනුවත්කමින් හෝ වැරදීමකින් හෝ ශිෂ්‍යයකු එවැනි නුසුදුසු වෙබ් අඩවියකට ප්‍රවේශ වුවහොත් ඒ පිළිබඳව වහාම පරිපාලක ගුරුභවතා (Administrator) වෙත වාර්තා කළ යුතු ය.
- සිසුන් අන්තර්ජාල පහසුකම භාවිත කළ යුත්තේ අධ්‍යාපනික අවශ්‍යතාවලට පමණි.
- අන්තර්ජාල හරහා (වෙබ් අඩවියකින් හෝ වෙනත් මාධ්‍යකින් හෝ) යම් තොරතුරක් බාගත කර වෙනත් අවශ්‍යතාවක් සඳහා භාවිත කරන්නේ නම් එහි ප්‍රකාශන අයිතිය සඳහන් කළ යුතු ය.
- කිසිම අවස්ථාවක පෞද්ගලික තොරතුරු අන්තර්ජාලය තුළින් ප්‍රකාශ කිරීමෙන් හෝ හෙළි කිරීමෙන් වැළකී සිටිය යුතු ය.
- පාසලේ තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තියට පටහැනි කිසිදු තොරතුරක් පළ කිරීමෙන් වැළකිය යුතු ය.
- අන්තර්ජාලය භාවිතයෙන් සිදුකරන සෑම කාර්යයක් ම අධීක්ෂණය හා නියාමනය කරන බව සිසුන් දැනුවත් කර ඇත.

## <u>විද්‍යුත් තැපැල් (E-Mail)</u>

- ගුරු භවතාගේ අවසරය හා නියාමනය මත පාසල තුළ දී විද්‍යුත් තැපැල් භාවිත කිරීම සිදු කළ යුතු ය.
- නීති විරෝධී හෝ නුසුදුසු හෝ අන් අයකුට හිරිහැරයක් සිදු කරන හෝ කිසිදු තොරතුරක් විද්‍යුත් තැපැල තුළින් හුවමාරු නොකළ යුතු ය.
- තමන්ගේ හෝ වෙනත් කිසිවකුගේ හෝ පෞද්ගලික තොරතුරු (ලිපිනය, දුරකථන අංකය, ඡායාරූප) විද්‍යුත් තැපැල තුළින් හුවමාරු නොකළ යුතු ය.
- විද්‍යුත් තැපැල මඟින් හෝ අන්තර්ජාලය තුළින් හෝ හඳුනාගත් කිසිම පුද්ගලයකු හා මුහුණට මුහුණ සංවාදයේ නොයෙදිය යුතු ය.
- විද්‍යුත් තැපැල හරහා ඇමුණුම් යැවීමේ දී ගුරු භවතාගේ අවසරය ඇතිව යැවිය යුතු ය.

## <u>අන්තර්ජාලය තුළින් සංවාද කිරීම (Internet Chat)</u>

- අන්තර්ජාලය තුළින් සංවාදයේ යෙදීම සඳහා පාසලෙන් අවසර ලබා ගත යුතු ය.
- අධ්‍යාපන කාර්යයන් සඳහා පමණක් අන්තර්ජාල සංවාදය යොදාගත හැකි අතර එයද ගුරුභවතකුගේ නියාමනය මත සිදු කළ යුතු ය.

## <u>වෙබ් අඩවි (Web Site)</u>

- පාසල් වෙබ් අඩවියේ පළ කිරීමට සිසුන්ට අවසර ලබා දෙනුයේ අනුමත විෂයය සන්ධාර පමණි.
- වෙබ් අඩවියේ සිසුන්ගේ තොරතුරක්, ඡායාරූපයක්, නිර්මාණයක් පළ කරන්නේ නම් එය දෙමාපිය අවසරය ලබා ගෙන සිදු කළ යුතු ය.
- අවසර සහිතව පාසල් වෙබ් අඩවියේ සිසුවකුගේ නිර්මාණයක් පල කරයි නම් එහි අයිතිය සිසුවා සතුය.

## <u>Personal Device</u>

- අන්තර්ජාල භාවිත ප්‍රතිපත්තියට අනුව සිසුන්ට තම පෞද්ගලික සන්නිවේදන උපාංග භාවිත කරමින් ඡායාරූප හෝ වීඩියෝ හෝ ගැනීම, යැවීම, අන්තර්ජාල ප්‍රවේශය ආදී කටයුතු පාසල තුළදී සිදු කළ නොහැකි ය.

<u>ඉහත උපදෙස් උල්ලංඝනය වන අවස්ථාවල දී,</u>

- විනය ක්‍රියාමාර්ග ගනු ලැබේ. (ලිඛිත අවවාද, කෙටිකාලීන අන්තර්ජාල ප්‍රවේශ අහිමි කිරීම ආදී)
- මෙවැනි වැරදි ක්‍රියා දිගින් දිගට ම සිදු කළහොත් ඉහළ අධිකාරියට දැනුම් දීමේ හැකියාව ද ඇත.

ඇමුණුම 02

**පාසල් හා පිරිවෙන් සඳහා 2017 ලබා දීමට නිර්දේශිත අන්තර්ජාල සබඳතා පැකේජ හා අන්තර්ජාල සේවා සැපයුම්කරුවන්**

| පිරිවිතර | | පැකේජය 1 | පැකේජය 2 | පැකේජය 3 | පැකේජය 4 | පැකේජය 5 | පැකේජය 6 | පැකේජය 7 |
|---|---|---|---|---|---|---|---|---|
| 1. අවම බාගත කිරීමේ වේගය (Minimum Download Bandwidth) | | 2 Mbps | 5 Mbps | 1 Mbps | 10 Mbps | 20 Mbps | 50 Mbps | 75 Mbps |
| 2. අවම උඩුගත කිරීමේ වේගය (Minimum Upload Bandwidth) | | 512 Kbps | 1 Mbps | 1 Mbps | 1 Mbps | 1 Mbps | 2 Mbps | 25 Mbps |
| 3. අන්තර්ජාල පිවිසුමකදී එකවර භාවිත කළ හැකි උපරිම උපාංග සංඛ්‍යාව | | 10 | 15 | 25 | 40 | 60 | 100 | 200 |
| 4. මාසික දත්ත අවශ්‍යතාව (කාල වේලාව් අනුව සීමා කිරීම් රහිත ව) | | 50 GB | 100 GB | 200 GB | 300 GB | 500 GB | 750 GB | 1 TB |
| 5. වෙබ් ෆිල්ටරින් පහසුකම | | ඇත | ඇත | ඇත | ඇත | ඇත | ඇත | ඇත |
| 6. CPE (Router) උපාංගයේ තිබිය යුතු අවම Ethernet පේනු (Port) සංඛ්‍යාව (Wi-Fi පහසුකම සහිත ව) | | Wi-Fi පහසුකම සහිතව අවම Ethernet පේනු (Port) සංඛ්‍යාව 02 | Wi-Fi පහසුකම සහිතව අවම Ethernet පේනු (Port) සංඛ්‍යාව 02 | Wi-Fi පහසුකම සහිතව අවම Ethernet පේනු (Port) සංඛ්‍යාව 04 | Wi-Fi පහසුකම සහිතව අවම Ethernet පේනු (Port) සංඛ්‍යාව 04 | Wi-Fi පහසුකම සහිතව අවම Ethernet පේනු (Port) සංඛ්‍යාව 04 | Wi-Fi පහසුකම සහිතව අවම Ethernet පේනු (Port) සංඛ්‍යාව 04 | Wi-Fi පහසුකම සහිතව අවම Ethernet පේනු (Port) සංඛ්‍යාව 08 |
| **මාසික ගාස්තුව (සියලුම බදු රහිත රු.)** | | | | | | | | |
| ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම | මාසික ගාස්තුව | 1,550/- | - | 6,600/- | 9,600/- | 15,200/- | 22,200/- | 28,000/- |
| | අමතර දත්ත සඳහා ගාස්තුව | 1GB ක් සඳහා 50/- | - | 1GB ක් සඳහා 50/- | 1GB ක් සඳහා 50/- | 1GB ක් සඳහා 50/- | 1GB ක් සඳහා 50/- | 1GB ක් සඳහා 50/- |
| ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් සමාගම | මාසික ගාස්තුව | - | 1,500/- | - | - | - | - | - |
| | අමතර දත්ත සඳහා ගාස්තුව | - | 5GB සඳහා 300/- හා 10 GB 500/- | - | - | - | - | - |

❖ ඉහත සඳහන් ගාස්තු බදු රහිතව සඳහන් කර ඇති අතර ගෙවීම් සිදු කිරීමේ දී අන්තර්ජාල සබඳතා සඳහා අදාළ වන සියලුම බදු සහිතව මාසික ගාස්තු ගෙවීම සිදු කළ යුතු වේ.

විශේෂ කරුණු - 2017 වර්ෂයට අදාළව කැඳවා ඇති මිල ගණන් අනුව ඉහත ගාස්තු සඳහන් කර ඇත. පැකේජ් අංක 1 හා පැකේජ් අංක 2 අවශ්‍යතාව පවතින පාසල් ඩයලොග් සමාගම මඟින් ලබා දෙන පැකේජ් අංක 2 හි සඳහන් ගාස්තුව යටතේ, පැකේජ් අංක 02 අන්තර්ජාල සබඳතා ලබා ගැනීම සුදුසු වේ. නමුත්, තාක්ෂණික වශයෙන් ඩයලොග් සමාගමේ සබඳතා ලබා ගැනීමේ හැකියාව නොමැති අවස්ථාවන් හී සුදුසු පරිදි ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ පැකේජ් අංක 1 මගින් අදාල අවශ්‍යතාවය සපුරා ගැනීම සිදු කළ යුතු වේ.

පැකේජ් 3,4,5,6 හා 7 අවශ්‍යතා පවතින අවස්ථාවල දී ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම මඟින් අදාල සබඳතා ලබා ගත යුතු වේ.

**ඇමුණුම 03**

**පාසල් හා පිරිවෙන් සඳහා අන්තර්ජාල සබඳතා ලබා දීමට එකඟ වී ඇති අන්තර්ජාල සැපයුම්කරුවන්ගේ සම්බන්ධීකරණ තොරතුරු**

1. ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම

   ගිණුම් කළමනාකරු - රාජ්‍ය ව්‍යාපාර

   දු. අංකය - 011-2303210 / 011-303214 / 071-8466523

   ෆැක්ස් අංකය - 011-2302585

   වෙබ් අඩවිය - www.slt.lk

2. ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් සමාගම

| පළාත | නම | දුරකථන අංකය |
|---|---|---|
| උතුරු පළාත | රස්නි ශහබ්දීන් මිය | 077-3336807 |
| නැගෙනහිර පළාත | රවී කරුණාරත්න මයා | 077-3339858 |
| වයඹ පළාත | චින්තක ජයබණ්ඩාර මයා | 077-7332415 |
| දකුණු පළාත | මොහොමඩ් රිනාස් මයා | 077-7334468 |
| ඌව/ සබරගමුව පළාත | එරංග රණසිංහ මයා | 077-7334377 |
| ගම්පහ/ මීගමුව ප්‍රදේශ | කපිල ඉන්ද්‍රජිත් මයා | 077-3336538 |
| කොළඹ ප්‍රදේශ/ බස්නාහිර පළාත | සුමේධ වීරසේකර මයා | 077-7334261 |
| | **සනත් සිරිවර්ධන මයා සාමාන්‍යාධිකාරී (බ්‍රෝඩ්බෑන්ඩ් සංවර්ධන හා ප්‍රවර්ධන)** | **077-7336997** |

3. අධ්‍යාපන අමාත්‍යාංශය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාව (යම් ගැටළුවක් සඳහා අවශ්‍ය වුවහොත් ඇමතීමට)

   දු. අංකය - 011-2784336

   ෆැක්ස් අංකය - 011-2785821

ඇමුණුම 04

අධ්‍යාපන අධ්‍යක්ෂ
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
"ඉසුරුපාය"
බත්තරමුල්ල

## පාසල්/ පිරිවෙන් සඳහා අධිවේගී අන්තර්ජාල පහසුකම් ලබා දීම

1. පාසලේ නම - ........................................
2. දුරකථන අංකය - ........................................
3. පළාත - ........................................
4. කලාපය - ........................................
5. Circuit ID/ Router No. - ........................................
6. නව අන්තර්ජාල සබඳතාව ලබා දුන් දිනය- ........................................
7. සබඳතාව ලබා දුන් අන්තර්ජාල සේවා සැපයුම්කරු - ........................................
8. ලබාදුන් සබඳතාවට අදාළ පැකේජය/ පැකේජ - ........................................
9. අන්තර්ජාල සබඳතා වේගය - ........................................
10. විදුහල්පතිගේ/ පරිවේණාධිපතිගේ නම - ........................................
11. විදුහල්පතිගේ/ පරිවේණාධිපතිගේ දුරකථන අංකය - ........................................
12. නව සබඳතාව සම්බන්ධ ව සම්බන්ධීකරණ ගුරුභවතාගේ නම - ........................................
    ගුරුභවතාගේ දුරකථන අංකය/ ජංගම දුරකථන අංකය - ........................................
    විද්‍යුත් තැපැල් ලිපිනය - ........................................

අදාළ අන්තර්ජාල සබඳතාව නියමිත පිරිවිතරවලට අනුකූල බවත්, භාවිත තත්ත්වයේ පවතින බවත්, සහතික කරමි.

........................................
විදුහල්පතිගේ/ පරිවේණාධිපතිගේ අත්සන

නිල මුද්‍රාව -

දිනය -